# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 34 දරන
# පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 ජූලි මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 ජූලි මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 34 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 ජූලි මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 40/89.

**1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 34 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනතේ 6 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 1 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) යම් භාණ්ඩයක යම් ලේබලයක්, විස්තරයක් හෝ ලකුණු කරන ලද මිලක් ඉවත් කරන, වෙනස් කරන, කපා හරින, මකා හරින හෝ විකෘති කරන යම් තැනැත්තකු හෝ ලේබලය, විස්තරය හෝ ලකුණු කරන ලද මිල ඉවත් කරනු ලැබුවේ, වෙනස් කරනු ලැබුවේ, කපා හරිනු ලැබුවේ, මකා හරිනු ලැබුවේ හෝ විකෘති කරනු ලැබුවේ යම් භාණ්ඩයකින් ද එම භාණ්ඩය විකුණන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන යම් තැනැත්තකු හෝ මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මේ පනතේ විධිවිධානවලින් කිසිවක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරමින් ක්‍රියා කරන සෑම තැනැත්තකුම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.".

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) (අ) 11 වන වගන්තියේ හෝ 12 වන වගන්තියේ හෝ 13 වන වගන්තියේ විධිවිධාන කඩ කිරීමේ හේතුවෙන් මේ පනත යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට—

(i) පළමු වරද සම්බන්ධයෙන් වූ විට රුපියල් එක් දහසකට අඩු නොවන සහ රුපියල් තුන් දහසකට වැඩි නොවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ; සහ

(ii) තදනන්තර වරදක් සම්බන්ධයෙන් වූ විට රුපියල් තුන් දහසකට අඩු නොවන හා රුපියල් හත් දහස් පන්සියය නොඉක්මවන දඩයකට සහ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට ද

ඔහු යටත් විය යුතු ය.

(ආ) (අ) ඡේදය මගින් කිසිම දඬුවමක් නියම කරනු ලැබ නැත්තාවූ, මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තකු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට—

(i) පළමු වරද සම්බන්ධයෙන් වූ විට රුපියල් තුන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම ; සහ

(ii) තදනන්තර වරදක් සම්බන්ධයෙන් වූ විට රුපියල් හත්දහස් පන්සියයක් නොඉක්මවන දඩයකට සහ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමකට ද

ඔහු යටත් විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.